# සාහිත්‍යකරුවා සිරකරුවකු වීම

ජාතක කතාව හුදු රස වින්දනය සඳහා පමණක් නිර්මාණය කෙරුණක් නො වී ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පෙර තිබූ සංස්කෘතිවල කලාව යනුවෙන් වෙන්කෙරුණු විෂයයක් නො තිබුණි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි කිසි දිනෙක කලාව හෝ ඉතිහාසය හෝ වෙනත් විෂයයක් හෝ අනෙක් ක්ෂෙත්‍රවලින් වෙන් නො කෙරිණි. එබැවින් ජාතක කතා හුදු කලා කෘති ලෙස සැලකිය නො හැකි ය. ජාතක කතා කියවීමට හා ලිවීමට වූ අරමුණු අතර අප කලින් සඳහන්කර ඇති ආකාරයට නිවනට සාපේක්ෂව මිනිසුන් යහමග යැවීමක් ද විය.

එහෙත් කෙටිකතාව හෝ නවකතාව හෝ එසේ නො වේ. ඒ අනෙක් ක්ෂෙත්‍රවලින් වෙන්කෙරුණු කලා කෘති වෙයි. මේ සාහිත්‍යාංගවලින් එක් කලෙක බලාපොරොත්තු වූයේ සමාජය විවරණයකිරීම ය. ඒ අදහස යුරෝපයේ කෙතරම් මුල් බැසගෙන තිබී ද යතහොත් සමාජ විද්‍යාව (Sociology) නමින් විෂයයක් මුලින් ම ඉදිරිපත් වූ අවස්ථාවේ දී ඇතැම් යුරෝපීය පඬුවන් අසා ඇත්තේ නවකතා තිබිය දී සමාජය ගැන විවරණයකිරීමට තවත් විෂයයක අවශ්‍යතාව කුමක් ද යන්න ය. නවකතාවක හෝ කෙටිකතාවක හෝ චරිත විකාශය වූයේ යම් සමාජීය පසුබිමක බැවින් නවකතාව හෝ කෙටිකතාව හෝ ඔස්සේ ඒ සමාජය ගැන දැනගැනීමේ හැකියාව ඇතැයි බටහිර පඬුවෝ විශ්වාස කළහ.

බටහිර සාහිත්‍යාංග මගින් නිරූපණයවන චරිත සාධාරණ චරිත යන හැඟීම පොදුවේ ගත්කල සමාජයේ තිබීම ඉහත සඳහන් විශ්වාසයට තවත් හේතුවක් විය. ඒ ඒ වියුක්ත චරිතය සාධාරණ මිනිස් ගුණ නිරූපණය කරන්නේ යැයි විශ්වාස කෙරුණු බැවින් ද සමාජ විවරණය යථාර්ථයක් ලෙස සැලකුණු බැවින් ද, ඒ මිනිස් චරිත ඔස්සේ ඒ ඒ සමාජයෙහි වූ යථාර්ථය නවකතාවෙන් හා කෙටිකතාවෙන් නිරූපණය විණි යැයි බටහිර පඬුවෝ සැබවින් ම විශ්වාසකළහ.

පසු කලෙක මේ සාහිත්‍යාංගවලින් කිනම් සංස්කෘතියකට සාපේක්ෂ ව හෝ යහමග යැවීමක් සිදුවිය යුතු ය යන්න බැහැර කිරිණි. ඒ අතර සාහිත්‍යකරුවන් කුමක් කීව ද සාහිත්‍යය ක්‍රමයෙන් සමාජ විද්‍යාවෙහි සිරකරුවකු බවට පත්විය. සාහිත්‍යයෙන් සමාජය නිරූපණය වියයුතු නම් හා සමාජය හා එහි විකාශය යථාර්ථයක් නම් සාහිත්‍යයට ඒ යථාර්ථයට පිටු පෑ නොහැකිය යන මතය තහවුරු කෙරිණි. එවිට ප්‍රශ්නය වනුයේ අප ඊනියා යථාර්ථය දැනගන්නේ කෙසේ ද යන්න ය. යථාර්ථය දැනගත හැක්කේ බටහිර විද්‍යාවන් හරහා යන මතය ද සමාජයෙහි තහවුරු කෙරී තිබුණු බැවින් සමාජ යථාරාථය හෙළිදරවු කිරීම සමාජ විද්‍යාවෙහි කාර්යභාරය විය.

සාහිත්‍යය ඇති බැවින් සමාජය ගැන ඉගෙනීමට සමාජ විද්‍යාවක් අවශ්‍ය දැයි ඇසූ බටහිරයන්ට දැන් සමාජ විද්‍යාව විසින් හෙළිදරවු කෙරෙන්නේ යැයි කියන ඊනියා යථාර්ථය සාහිත්‍යයෙහි තිබේදැයි සෙවීමට සිදුවිය. සාහිත්‍යකරුවා ඊනියා සමාජ යථාර්ථය නිරූපණයකරන්නකු බවට පත්වූයේ එලෙස ය. සාහිත්‍යය නිර්මාණයක් ලෙස සැලකුණ අතර සමාජ විද්‍යාව ඊනියා යථාර්ථය දැනගැනීමේ මගක් ලෙස සැලකිණි. එහෙත් සාහිත්‍යකරුවන් මෙන් ම සමාජ විද්‍යාඥයන් ද නොදැනසිටි කරුණ නම් සමාජ විද්‍යාව ද සාහිත්‍යය මෙන් ම නිර්මාණයක් බව ය.

අපේ ප්‍රවාදවල මූලික කරුණක් නම් දැනුම යනු නිර්මාණයක් බව ය. ඒ දැනුම ද අප විසින් නිර්මාණය කෙරුණු එකකි. වෙනත් වචනවලින් කියන්නේ නම් දැනුම නිර්මාණයක් ය යන්න ද නිර්මාණයකි. අප ඒ දැනුම නිර්මාණයකර ගන්නේ අවිජ්ජා පච්චයා සංඛාරා යන්න ගුරුකොට ගනිමිනි. අවිද්‍යාව නිසා අපි දැනුම සංස්කරණයකරමු. මෙහි දී අවිද්‍යාව යනුවෙන් හැඳින්වෙන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම පිළිබඳ අනවබෝධය ය. මේ කරුණු අප මෙයට ඉහත විස්තරකර ඇති බැවින් නැවත තේරුම්කිරීම අනවශ්‍ය ය. එහෙත් අදත් මේ පිළිබඳ විවිධ ප්‍රශ්න මතුකෙරෙන බැවින් ඒ හා සම්බන්ධ වෙනත් යමක් කීමට මේ අවස්ථාව කරගත හැකි ය.

දැනුම යනු නිර්මාණයක් ය යන්නෙන් ඇතැම් අය තේරුම්ගන්නේ, එනම් ඔවුන් නිර්මාණයකරන්නේ, අපේ දර්ශනය ද විඥානවාදී වූවක් ලෙස ය. විඥානවාදීන්ට අනුව බාහිර ලෝකය යන්න මිනිසාගේ නිර්මාණයකි. ද්‍රව්‍යවාදීන්ට හෙවත් භෞතිකවාදීන්ට අනුව අපෙන් තොරව ද්‍රව්‍ය පවතියි. ඔවුන්ට අනුව ගස යන්නට මිනිසාගේ මනසින් තොර පැවැත්මක්

© Prof. Nalin De Silva

ඇත. මිනිසුන් සිටියත් නැතත් ගස් පවතියි. එහෙත් විඥානවාදීන්ට අනුව ගස යන්නෙන් අදහස්කෙරෙන්නේ මනසෙහි ඇතිවන වේදනා රාශියක එකතුවක් පමණකි.

විඥානවාදීන්ට අනුව ගස යනුවෙන් දෙයක් නැත. ඔවුන් කියන්නේ ගස යනු එහි පැහැය, තදබව, සුවඳ ආදී වශයෙන් මනසට දැනෙන වේදනා රැශියක් එකතු වූ තැන මිනිසා විසින් ගස යනුවෙන් දෙයක් නිර්මාණය කෙරෙන බව ය. වෙනත් වේදනා කිහිපයක් එකතු වූ තැන මිනිසා පුටුව යන සංකල්පය නිර්මාණයකරයි. විඥානවාදීන් ද්‍රව්‍ය මනසෙහි නිර්මාණයක් යැයි කියන්නේ ඒ අර්ථයෙනි. පුටුව යනුවෙන් දෙයක් නැතත් මනසෙහි වේදනා කිහිපයක් එකතුකර මනස පුටුව යනුවෙන් දෙයක් නිර්මානයකරයි යන්න මෙහි තේරුම වෙයි.

එහෙත් පැහැය, ගඳ, සුවඳ, මුදු බව, තද බව ආදිය කෙසේ ඇතිවන්නේ ද යන්න පිළිබඳව විඥානවාදීන් පැහැදිලි ව යමක් නොකියන බව අපේ මතය වෙයි. ඒවා මනසෙහි පහළවන වේදනා බව සැබෑ මුත් ඒ වේදනා නිර්මාණයක් ද යන්න විඥානවාදීන් අතින් නො කියැවෙයි. එහෙත් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි දී අපි ඒ වේදනා ද මනසෙහි නිර්මාණ යැයි පවසමු. එලෙස ගත්කල අප විඥානවාදීන්ට ද වඩා විඥානවාදීන් යැයි යමකු කියනු ඇත. අප විඥානවාදීන්ගෙන් වෙනස්වන්නේ ඒ කරුණෙහි දී පමණක් නො වෙයි. මනසේ පැවැත්ම ද අපි ප්‍රශ්නකරමු. මනස ද නිර්මාණයක් යැයි අපි කියමු. මනස ද මනසෙහි නිර්මාණයක් වන්නේ යැයි අපි කියමු. ඒ සිදුවන්නේ කෙසේ දැයි අප විසින් විස්තරකෙරී ඇත.

දැන් අපි නැවතත් පුටුව යන්නට නැවතත් යමු. ද්‍රව්‍යවාදියාට අනුව පුටුවට මිනිසාගේ මනසින් තොරව පැවැත්මක් ඇත. විඥානවාදියාට පුටුව යනු මිනිස් මනසෙහි ඇතිවන වේදනා රැශියක එකතුවක් පමණකි. අපට පුටුව යන්න අනිත්‍ය, දුක්ඛ, අනවබෝධය නිසා අප විසින් නිර්මාණයකෙරෙන සංකල්පයක් පමණකි. මෙහි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු සංකල්ප නොවන බවත් ඒ මිනිස් මනසින් තේරුම්ගැනීමට, එනම් නිර්මාණයකිරීමට, නොහැකි බවත් අපේ අදහස වෙයි.

අනිත්‍ය, දුක්ඛ,අනාත්ම අවබෝධය යනු නිවන් අවබෝධය ය. ඒ මනසින් කෙරෙන අවබෝධයක් නො වෙයි. මනසින් යමක් අවබෝධකෙරෙන්නේ අවිද්‍යාව නිසා ය. ඒ අවබෝධය යනු අන්කිසිවක් නොව නැති දෙයක් ඇතැයි යනුවෙන් ගැනීම ය. ඒ නැති බව අවබෝධකරගැනීම නිවන් අවබෝධය වෙයි. අප විසින් නිර්මාණයකෙරී ඇති භයානක ම සංකල්පය පුටුව හෝ ගස හෝ වෙනත් එවැන්නක් හෝ නොව මම යන්න ය. මම යනුවෙන් කිසිවකු නැතිවිට අනවබෝධයෙන් මම කෙනකු නිර්මාණය කෙරී ඇත. මම ද නැතිකළ පුටුවක් හෝ ගසක් හෝ ඇත්තේ කොහේ ද?

ඇතැමකුට අනුව ප්‍රාග්ධනය ඇත. මේ ප්‍රාග්ධනය ද ගුරුත්වාකර්ෂණය මෙන් ම නිර්මාණයකි. ගුරුත්වාකර්ෂණය නිර්මාණය කෙරුණේ නිව්ටන් විද්වතා අතිනි. ඔහු ගුරුත්වාකර්ෂණය නිර්මාණය කෙළේ පොළොවට පොල් (ඇපල්) වැටෙන්නේ ඇයි ද ආදී කරුණු පැහැදිළිකිරීම සඳහා ය. ප්‍රාග්ධනය යන්න කාල් මාක්ස් පඬිවරයාගේ නිර්මාණයකි. කාල් මාක්ස් පඬිවරයා ප්‍රාග්ධනය නිර්මාණයකෙළේ වත්මන් සමාජයෙහි ක්‍රියාකාරකම් තේරුම්ගැනීම සඳහා ය. මෙහි දී තේරුම්ගත යුත්තක් නම් සමාජය යන්න ද අපේ නිර්මාණයක් බව ය. කාල් මාක්ස් පඬිවරයා මේ සමාජය ධනපති සමාජයක් ලෙස තේරුම් ගනියි. එනම් ඔහු එහි දී ධනපති සමාජය යන්න නිර්මාණයකර ඇත.

නිව්ටන් විද්වතාගේ ගුරුත්වාකර්ෂණය වෙනුවට අයින්ස්ටයින් විද්වතා අවකාශ කාලයෙහි වක්‍රතාව යන සංකල්පය නිර්මාණයකර එමගින් පොළොවට පොල් වැටෙන්නේ කෙසේ දැයි තේරුම්කර දුන්නේ ය. (ඇතැම් හේතුවාදී පුස්සන්ට මේ වක්‍රතාව යන සංකල්පය නොතේරෙන බව ඔවුන් පුවත්පත්වලට ලියන ලිපිවලින් පැහැදිළි වෙයි. ස්කන්ධය වැඩි වස්තුවක් දෙසට වක්‍රතාව තුඩක් මෙන් වැඩිවී ඇත වැනි අදහස් ඔවුන් අතින් ප්‍රකාශවන්නේ එබැවිනි.) අයින්ස්ටයින් පඬිවරයා එලෙස වක්‍රතාව හඳුන්වාදීමට පෙර අවුරුදු දෙසීය පනහක පමණ කාලයක් තිස්සේ නිව්ටන් පඬිවරයාගේ ගුරුත්වාකර්ෂණය ඊනියා යථාර්ථයක් ලෙස හඳුනාගෙන සිටි බව අමතක නොකළ යුතු ය. එලෙස ම මාක්ස් පඬිවරයාගේ ප්‍රාග්ධනය වෙනුවට වෙනත් අයකු, ඇතැම් විට තවත් අවුරුදු සියයක් ගතවීමෙන් පසුව, වෙනත් සංකල්පයක් නිර්මාණයකර සමාජ ක්‍රියාකාරකම් තේරුම්කර දෙනු ඇත. මේ එකක්වත් යථාර්ථයක් නො වෙයි. ඒ සියල්ල, මනස ද ඇතුළුව, මනසෙහි නිර්මාණ පමණක් වෙයි.

© Prof. Nalin De Silva

මෙහි දී මේ පිළිබඳ ව තවත් විස්තර අනවශ්‍ය යැයි සිතමි. අපි නැවතත් ඊනියා සමාජ යථාර්ථය යන්න සලකමු. අප කියා සිටියේ සාහිත්‍යයෙන් ඊනියා සමාජ යථාර්ථයක් නිරූපණයකෙරෙන්නේ යැයි කීමෙන් සාහිත්‍යකරුවා සමාජ විද්‍යාවෙහි සිරකරුවකු කෙරී ඇති බව ය. අද ලෝකයේ විවිධ යථාර්ථ නිර්මාණය කෙරී ඇත. ලිබරල්වාදීන්ගේ සමාජ යථාර්ථය, සමාජ සත්තා යථාර්ථය, අධියථාර්ථය, ඉන්ද්‍රජාලික හෙවත් මායාකාරී යථාර්ථය ආදිය ඉන් සමහරකි. යථාර්ථය යන්නෙහි නිර්වචනය අනුව වුව ද තිබිය හැක්කේ එක් යථාර්ථයක් පමණකි. යථාර්ථ ගණනාවක් තිබීමෙන් පෙන්නුම්කරන්නේ ද මේ යථාර්ථ යනු ඊනියා යථාර්ථයක් නොවන බව ය.

මේ විවිධ යථාර්ථ යනු සිරගෙවල් පමණකි. සාහිත්‍යකරුවා මේ සිරගෙවල්වල සිරකරුවකු බවට පත්කෙරී ඇත. එහෙත් සාහිත්‍යකරුවාට නිදහසක් නැතැයි මෙයින් නො කියැවෙයි. සාහිත්‍යකරුවාට මේ සිරගෙවල්වලින් එකක් හෝ කිහිපයක් හෝ තෝරාගැනීමේ නිදහස ඇත. සාහිත්‍යකරුවා අද තම නිර්මාණකළ යුත්තේ මේ එක් සිරගෙදරක නීති රීතිවලට යටත් වී ය. ඔහු එක්කෝ ලිබරල් යථාර්ථයෙහි  ප්‍රවාදවලට අනුව ලිවිය යුතු ය. එසේත් නැත්නම් මාක්ස්වාදී යථාර්ථයෙහි නීති රීතිවලට (ප්‍රවාදවලට) අනුව තම චරිත නිර්මාණය කළ යුතු ය. එසේත් නැත්නම් තමන් දන්නේ යැයි සිතන කසිකබල් මනෝවිශ්ලේෂණයකට අනුව තම කෘතියෙහි චරිත නිර්මාණයකළ යුතු ය. මේ ඇතැම්හු ලංකාවේ දී තමන්ට හරිහැටි නොතේරෙන ෆ්‍රොයිඩ්, යුංග්, ලකාන් ආදී ඊනියා මනෝවිශ්ලේෂකයන්ගේ  කසිකබල් මතවලට අනුව තම කෘතිවල චරිත නිර්මාණයකරති. මේ මනෝවිශ්ලේෂකයන් එක් අයකුවත් බටහිර විද්‍යාවට අනුව ක්‍රියා නොකරන බවවත්, ඊනියා මනෝවිශ්ලේෂණය බටහිර විද්‍යාවක් ලෙස බටහිර විද්‍යාඥයන් නොපිළිගන්නා බවවත් තමන් විද්‍යාත්මක මත දන්නා බව අඟවන පඬියෝ නො දනිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva